## 14 – රස ගීත ගයාලා

රස ගීත ගයාලා – නෙත දෙව්ඳු යොමාලා
නෙක මලින් පුදාලා – පසසමු සක් පිඹලා

රස ගීත නදින් – සෙත ලබන ලෙසින්
පසසාලම් දෙව් සමිඳා //

ආ! දෙව්ඳු බලතුමෝ – වෙයි අපගෙ රජතුමෝ
යනු දෙසට දෙවිතුමෝ – දස දෙසේ සියලුමෝ

ඔබ වනා පිනවමු – ඔබ නම පතුරවමු
සිඹ දෙපා නමදිමු – සොබ සමිඳු දකිනෙමු

සැම විට ඔබ යදිනා – ඔබ දරු ලොවෙ වසනා
සුබ සෙත් සිරි යදිනා – සැම දින පෙම් හදිනා